Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීම

### සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණුදීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු නීතිඥයකු වශයෙන් සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.);

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදළ පළපුරුද්ද ලබා තිබීම.

(1) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
(2) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
(3) අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු,
(4) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
(5) විවිධ ආයතනවලින් පවත්වනු ලබන නීති කටයුතුවලට අදළ පරීක්ෂණ සම්බන්ධ කටයුතු,
(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) *වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය,
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත්වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේක අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630- 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL-1-2016 වැටුප් කාණ්ඩය වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්* :** | | **25** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය | 25 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | ● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | ● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 05 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 05 | |
| | *සටහන* : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 05ක් ලබා දිය යුතුයි. (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| 02 | ***අතිරේක වෘත්තීය පළපුරුද්ද* :** | | |
| | I. *අතිරේක වෘත්තීය සුදුසුකම්* :- | 10 | 35 |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට වැඩි හා මාස 06කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්) (අංක 01 යටතේවන ලකුණු ලබාදුන් සහතික හැර වෙනත්) | | |
| | II. *අතිරේක පළපුරුද්ද* :- | | |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද | | |
| | එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25ක් මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02 | 25 | |
| | (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර). | | |
| | (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේ දී අයඳුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතිකපත් මගින් සනාථ කළ යුතුය.) | | |
| 03 | ***තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :***<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>මාස 06/පැය 720<br>මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | 10<br><br>07<br><br>05<br>03 | **10** |
| 04 | **භාෂා ප්‍රවීණතාවය**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාල විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් (වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>මාස 06/පැය 720<br>මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | 15<br><br>10<br><br>07<br>05 | **15** |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය**<br>i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම<br>iii. පැහැදිලි අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05<br>05<br>05 | **15** |
| | එකතුව | | **100** |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :-

(i) අයදුම්පත් 2019 අගෝස්තු 26 දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
සමාගම් මැදුර, අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

(ii) ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.1 සිට 5.1 දක්වාත් දෙවැනි පිටුව 5.2 සිට 7 දක්වාත් තෙවැනි පිටුව 8 සිට 9 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 47,615 කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :-
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන්
නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු
හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

2019 ජූලි මස 11 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව***

*විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019*
Category Structured Interview for Recruitment to the post of Legal officer of Executive Service Category Grade III - 2019

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(1) 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(උදා : HERATH MUDIYANSALAGE SAMAN KUMARA GUNAWARDENA)

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා : GUNAWARDENA H.M.S.K.)

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :—————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(2) 2.1 ස්ථිර ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(3) 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐ පුරුෂ - 0 ☐

(අදාල අංකය කොටුව තුල ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 2019.08.26 දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.4 දුරකථන අංකය : | | | | | | | | | | |

(4) 4.1 අධ්‍යාපන සුදුසුකම් :
උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමට අදාළ වූ අධ්‍යාපන සහතික පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය :
(i) විශ්වවිද්‍යාලය හෝ ආයතනය :—————.
(ii) උපාධිය හෝ අධ්‍යාපන සහතිකයේ නම :—————.
(iii) උපාධිය හෝ අධ්‍යාපන සහතිකය වලංගු වන දිනය :—————.
(iv) පන්තිය :—————.

5.0 නීති ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :—————.

6.0 පරිගණක ක්ෂේත්‍රයේ පළපුරුද්ද :—————.

7.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :—————.

8.0 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :—————.

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද : (අදාළ කොටුවේ හරි ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

.......................................................................................................................
.......................................................................................................................

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————.
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට .............. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

—————.
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................ මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)